චක්‍රලේඛ අංක : 02 / 2014

මගේ අංකය : බප/සසේකො/6 චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව( බ.ප.),
121/3,
කිරුළපන මාවත,
කොළඹ 05.
2014.01. 06 -

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
ස.ණ.ස. සමිතිවල සභාපතිවරුන් වෙත ,

**<u>සමුපකාර සමිතියක් / සංගමයක් වසා දැමීමේදී ස්ථිර සේවකයන්ට වන්දි ප්‍රදානය කිරීම.</u>**

යම් සමුපකාර සමිතියක් / සංගමයක් වසා දැමීමේදී එකී සමිතියේ / සංගමයේ ස්ථිර සේවයේ යෙදී සිටි සේවකයින් ඉවත් කිරීමේදී ඔවුන්ට තම සේවය අහිමිවීම සම්බන්ධයෙන් පහත සඳහන් ආකාරයට වන්දි ගෙවීම සිදු කල යුතුය.

I. වර්ෂ එකක් හෝ ඊට වැඩි ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවක සේවිකාවන් මෙම චක්‍රලේඛය යටතේ වන්දි හිමිකම් ලැබීමට සුදුසුකම් ලබයි.

II. වන්දි මුදල් ගණනය කළ යුත්තේ වන්දි ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දිනය/ සමිතිය වසා දමනු ලද දිනය/ සමිතිය ඈවර කරනු ලබන දිනය යන දිනයන් අතරින් මුලින් යෙදෙන දිනය ට සේවකයා ලබමින් සිටි දීමනා සහිත මූලික වැටුප පදනම් කර ගනිමිනි. මෙහි දීමනා වශයෙන් සැලකිය යුතු වන්නේ විධිමත් අනුමැතියක් සහිතව ගෙවන ලද දීමනා පමණක් වේ.

III. විනය ක්‍රියාමාර්ගවලට යටත්ව සිටින හෝ සේවා තත්ත්වයන් පිළිබඳ නොවිසඳුණු ගැටළු පවතින හා ඒ සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවක, සමුපකාර සේවක කොමිෂන් සභාවේ හෝ අධිකරණයේ විමර්ශනයක් හෝ විභාගයක් හෝ පැවැත්වෙන අවස්ථාවකට මුහුණ පා සිටින සේවක සේවිකාවන් හට මෙම වන්දි මුදල් ඉල්ලා සිටීමට හිමිකමක් නැත. එහෙත්, එවැනි පරීක්ෂණයකින් අනතුරුව නිර්දෝශීභාවය තහවුරු වන්නා වූ සේවකයෙකුට/සේවිකාවකට මෙම චක්‍රලේඛය යටතේ වන්දි ඉල්ලුම් කිරීමට හිමිකම ලැබෙනු ඇත.

IV. සමිතිය සමඟ කුමන හෝ ආකාරයේ බැඳුම්කරයක් යටතේ අනිවාර්ය සේවා කාලයක් සපුරාලීමට නියමිතව සිටින සේවකයින් එම බැඳුම්කරය ප්‍රකාරව, තවදුරටත් සේවය කිරීමට නියමිත නම්, එකී බැඳුම්කරයට අදාල වන මුදල් වන්දි මුදලින් අඩු කර ගත යුතුය.

V. අදාල සේවකයින්ගෙන් සමිතියට අයවිය යුතු කිසියම් මුදලක් වේ නම් එම මුදල් ගෙවිය යුතු වන්දි මුදලින් අය කර ගත යුතුය.

VI. සමිතිය / සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමිතිය වසා දැමීමේදි සේවකයන්ට වන්දි ගෙවීම පිළිබඳව ගනු ලබන තීරණයක් මෙම චක්‍රලේඛයෙහි සඳහන් විධිවිධාන වලින් වෙනස් වන්නේ නම් එහිදී සේවකයින්ට වඩාත් වාසිදායක ක්‍රමවේදය අනුගමනය කළ යුතු වේ.

VII. ගණනය කිරීම පහත පරිදි සිදු කළ යුතුය

(අ) වන්දි මුදල් ගණනය කිරීමේ දී මාසික වැටුප ලෙස සැලකිය යුත්තේ, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ද ඇතුලත් ඒකාබද්ධ වැටුපය. එය සේවකයා විසින් අවසන් වරට ලබා ගත් වැටුප හා/හෝ කොමිෂන් සභා චක්‍රලේඛ විධිවිධාන පරිදි සේවකයාට හිමි විය යුතුව තිබෙන, සේවකයාට වැඩි වාසියක් හිමිවන වැටුප විය යුතුය.

0332248781 , 0332234638

(ආ) සේවකයා සමුපකාර සමිතියේ සේවය කළ සම්පූර්ණ වර්ෂයක කාලයක් සඳහා මාසික වැටුපට සමාන මුදලක් සේවය කළ සම්පූර්ණ වර්ෂ ගණනින් ගුණ කිරීමෙන් ලැබෙන අගයට සමාන මුදලක් සහ එම සේවකයා අවුරුදු 60 දී විශ්‍රාම යාමට නියමිත වුවෙකු ලෙස සලකා වයස අවුරුදු හැට ( 60 ) වන තෙක් ඉදිරියට සේවය කිරීමට ඇති සම්පූර්ණ වර්ෂ ගණන වෙනුවෙන් එක් වර්ෂයකට මාස භාගයක ( ½ ) ක වැටුප බැගින් ගණනය කිරීමෙන් ලැබෙන අගයට සමාන මුදලක් වන්දි වශයෙන් සමිතිය විසින් සේවකයාට ගෙවිය යුතුය. එසේවුවද වුවත්, සේවකයෙකුට ගෙවනු ලබන මුළු වන්දි මුදල රුපියල් දොළොස් ලක්ෂ පනස් දහස ( රු.1,250,000/- ) නොඉක්මවිය යුතුය.

(ඇ) වර්ෂයකට අඩු මාස සහ දින ගණන් සඳහා අනුපාතිකව ගණන් බැලිය යුතු වේ.

උදාහරණ :

I. වයස අවුරුදු 25 දී සේවයට බැඳුණු A නමැති සේවකයා වන්දි ප්‍රදානය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට ලැබූ දීමනා සහිත (විධිමත් අනුමැතියක් සහිත) මාසික වැටුප රු.20,000/- කි.
එදිනට ඔහු ගේ ස්ථිර තනතුරේ සේවා කාලය අවුරුදු 15කි.
ඒ අනුව, සේවය කළ කාලය සඳහා වන්දි මුදල = 20,000 X 15 = 300,000/-

II. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට ඔහු වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීම සඳහා සේවය කළ යුතු අවුරුදු 20 කාලය සඳහා වන්දි මුදල = මාස ½ කවැටුප X ඉදිරියට සේවය කිරීමට ඇති වර්ෂ ගණන
= 10,000 X වසර 20 = 200,000/-

III. ගෙවිය යුතු මුළු වන්දි මුදල = 300,000 + 200,000
= 500,000/-

මෙම චක්‍රලේඛය බස්නාහිර පළාත් සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්/ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ එකඟතාවය මත බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියමය පරිදි නිකුත් කරන ලදී.

ඩබ්.පී.එම්.ජී.ආර්.ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :

01. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත
02. ලේකම්, බස්නාහිර පළාත් ප්‍රවාහන හා සමුපකාර සංවර්ධන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු,ආහාර සැපයීම් හා බෙදා හැරීම්, ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය -බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
04. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
05. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
06. සියළුම සමුපකාර සේවක වෘත්තීය සමිති